ලංකාදීප

# ජාතික ආරක්ෂක උපාය මාර්ග සංග්‍රහය පිළිගන්වමින්...

දේශීය බුද්ධි පර්යේෂණ ආයතනයක් වන පාත්ෆයින්ඩර් පදනම වසර 2020 සඳහා ශ්‍රී ලංකාවට පදනම් විය යුතු ජාතික ආරක්ෂක උපාය මාර්ග සංග්‍රහය සකස් කර ඇති අතර එහි පිටපත් කොටුගොඩ ධම්මාවාස ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ මහ නාහිමි සහ ඉත්තෑපානේ ධම්මාලංකාර, කෝට්ටේ ශ්‍රී සාමග්‍රී සංඝ සභාවේ මහානායක හිමිපාණන් වහන්සේලා වෙත පිළිගැන්වුණු අවස්ථාවයි මේ.

ස්වෛරීත්වය තහවුරු කිරීම සහ ත්‍රස්තවාදී අරමුණු පරාජය කර ජනතාව සුරක්ෂිත කරන සැලසුම සඳහා විකල්ප අදහස් එහි ඇතුළත්ය.

ආරක්ෂාව සම්බන්ධ විකල්ප අදහස් සහිත යෝජනා සම්පාදනය කිරීම මෙරට දී කරන ලද පළමු වතාව වන අතර ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්, පරිපාලන හා රාජ්‍ය තාන්ත්‍රික ප්‍රධානීන්, අන්තර් ජාතික ප්‍රවීණයන් සහ ශාස්ත්‍රවේදීන් එකතු වී විසිඑක් වැනි සියවසේ ජාතික ආරක්ෂක ප්‍රතිපත්ති ඉදිරියේ අවධානය යොමු කළ යුතු අංශ කෙරෙහි මෙම නිබන්ධනය සකස් කිරීමේදී අවධානය යොමුකර ඇත.

පාත්ෆයින්ඩර් පදනම නිර්මාතෘ මිලින්ද මොරගොඩ, සභාපති බර්නාඩ් ගුණතිලක, සම්පත් දායක හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සිසිර පින්නවල සහ විධායක අධ්‍යක්ෂක ලක්ෂ්මන් සිරිවර්ධන යන මහත්වරු මෙම අවස්ථාවට සහභාගි වූහ.

